## 04. වතු භාවිතය පිළිබඳ තොරතුරු

ලැයිස්තු ගත කිරීමේ අදියරේදී සකසන ලද සාරාංශ වාර්තා ඇසුරින් වතු ව්‍යාප්තිය පිළිබඳ සකසන ලද තොරතුරු පහත දක්වා ඇත.

### 4.1:වතු සංඛ්‍යාවසහ බිම් ප්‍රමාණය

**වගුඅංක 1:දිස්ත්‍රික්ක අනුව වතුවල ව්‍යාප්තිය**

| දිස්ත්‍රික්කය | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | |
|---|---|---|---|
| | | අක්කර | හෙක්ටයාර |
| 1.කොළඹ | 100 | 13,311 | 5,387 |
| 2.ගම්පහ | 408 | 18,387 | 7,441 |
| 3.කළුතර | 325 | 65,493 | 26,505 |
| 4.මහනුවර | 321 | 61,343 | 24,825 |
| 5.මාතලේ | 271 | 30,247 | 12,241 |
| 6.නුවරඑළිය | 252 | 142,427 | 57,639 |
| 7.ගාල්ල | 249 | 37,573 | 15,206 |
| 8.මාතර | 306 | 34,260 | 13,865 |
| 9.හම්බන්තොට | 113 | 10,119 | 4,095 |
| 10.යාපනය | 5 | 313 | 127 |
| 11.කිළිනොච්චිය | 212 | 10,891 | 4,408 |
| 12.මන්නාරම | 6 | 1,299 | 526 |
| 13.වව්නියාව | 7 | 229 | 93 |
| 14.මුලතිව් | 29 | 1,215 | 492 |
| 15.මඩකලපුව | 40 | 3,212 | 1,300 |
| 16.අම්පාර | 23 | 2,444 | 989 |
| 17.ත්‍රිකුණාමලය | දිස්ත්‍රික්කයේ වතු නොමැත | | |
| 18.කුරුණෑගල | 1,783 | 101,687 | 41,152 |
| 19.පුත්තලම | 1,239 | 58,736 | 23,770 |
| 20.අනුරාධපුරය | 55 | 7,452 | 3,016 |
| 21.පොළොන්නරුව | 59 | 8,557 | 3,463 |
| 22.බදුල්ල | 207 | 76,073 | 30,786 |
| 23.මොණරාගල | 95 | 13,941 | 5,642 |
| 24.රත්නපුර | 554 | 83,694 | 33,870 |
| 25.කෑගල්ල | 343 | 83,163 | 33,656 |
| **ශ්‍රීලංකාව** | **7,002** | **866,066** | **350,492** |

මෙම වර්ෂයේ (2013) අගෝස්තු මාසයේ පැවැත්වූ වතු ලැයිස්තුගත කිරීමේ අදියරේදී ලබාගත් තොරතුරු අනුව ශ්‍රීලංකාවේ වාර්තාවී ඇති මුළු වතු සංඛ්‍යාව 7,002කි. මෙම සංඛ්‍යාව 1982 කෘෂිකර්ම සංගණනයේදී 9,291 ක් ලෙසද 2002 කෘෂිකර්ම සංගණනයේ දී 6,577ක් ලෙසද වාර්තාවී ඇත. වර්ෂ 1982

සමග සසඳන විට 2002 වර්ෂයේ වතු සංඛ්‍යාව 2,714කින් අඩුවී ඇති අතර 2002 වර්ෂය සමග සසඳන විට මෙවර වතු සංඛ්‍යාව 425කින් වැඩිවී ඇති බව විශේෂයෙන් සඳහන් කළ යුතුයි.

**4.1.1:දිස්ත්‍රික්ක අනුව වතු සංඛ්‍යාවේ ව්‍යාප්තිය**

මෙම වසරෙහි (2013) දිස්ත්‍රික් අනුව මෙම වතුවල ව්‍යාප්තිය පිළිබඳ අවධානය යොමු කරන විට 2002 වර්ෂය මෙන්ම මෙවරත් වැඩි වතු සංඛ්‍යාවක් කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තාවී ඇත. එම සංඛ්‍යාව 1,783 කි. නමුත් 2002 වර්ෂයේ දී කුරුණෑගල දිස්ත්‍රික්කයේ වතු සංඛ්‍යාව 2,017 ක් ලෙස වාර්තාවී ඇති අතර මෙවර වතු සංඛ්‍යාව 234 කින් පහත වැටී ඇත.

කුරුණෑගල දිස්ත්‍රික්කය හැරුණු විට පුත්තලම් දිස්ත්‍රික්කයෙන් දෙවනුවට වැඩි වතු සංඛ්‍යාව (1,239) වාර්තාවී ඇත. රත්නපුර (554), ගම්පහ (408), කෑගල්ල (343), කළුතර (325), මහනුවර (321), මාතර (306) යන දිස්ත්‍රික්කවල 300 – 400ත් අතර වතු සංඛ්‍යාවක් වාර්තාවී ඇත. මාතලේ (271), නුවරඑළිය(252), ගාල්ල (249), කිලිනොච්චි (212), බදුල්ල (207), හම්බන්තොට (113), කොළඹ (100) යන දිස්ත්‍රික්කවල 100 – 300ත් අතර වතු සංඛ්‍යාවක් වාර්තාවී ඇත. වතු සංඛ්‍යාව 100ට අඩු දිස්ත්‍රික්ක ලෙස මොණරාගල (95), පොළොන්නරුව (59), අනුරාධපුර (55), මඩකලපුව (40), මුලතිව් (29), අම්පාර (23), වව්නියාව (7), මන්නාරම (6), යාපනය (5) වාර්තාවී ඇත. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයෙන් එකදු වත්තක් හෝ වාර්තාවී නොමැත. (වගු අංක1)

**4.1.2:පළාත් අනුව වතුසංඛ්‍යාවේ ව්‍යාප්තිය**

පළාත් මට්ටමින් සැලකිල්ලට ගත්විට වැඩිම වතු වාර්තාවී ඇත්තේ වයඹ පළාතිණි. එම සංඛ්‍යාව 3,022ක් වේ. මෙය ශ්‍රී ලංකාවේ මුළු වතු සංඛ්‍යාවෙන් 43% කි. අඩුම වතු සංඛ්‍යාව වාර්තාවී ඇත්තේ නැගෙනහිර පළාතිණි. එය සංඛ්‍යාව 63 කි. මෙය මුළු වතු සංඛ්‍යාවෙන් 1%කි. නමුත් 2002 කෘෂිකර්ම සංගණනයේ වතු සංඛ්‍යාව සමග සසඳන විට මෙම පළාතේ වතු සංඛ්‍යාව 2013 වසරේ වතු ලැයිස්තු ගත කිරීමේ දී වැඩිවීමක් දැකිය හැක්කේ 2009 වසරේදී උදාවූ සාමකාමී වාතාවරණය නිසා මෙම ප්‍රදේශයේ ජනතාව, පුද්ගලික සමාගම් සහ රජය වතු අංශය සංවර්ධනය කිරීමට දක්වන වැඩි උනන්දුව මීට හේතුවී ඇත.

එමෙන්ම 2002 වර්ෂයේ කෘෂිකර්ම සංගණනයේදී උතුරු පළාතේ ඇති වතු සංඛ්‍යාව එක් වත්තක් ලෙස වාර්තාවී ඇති අතර 2013 වන විට එම වතු සංඛ්‍යාව 259 දක්වා වැඩිවී ඇත. මීට ප්‍රධාන හේතුව 2009 වර්ෂයෙන් පසුව රටේ ඇතිවූ සාමකාමී පරිසරය තුළ විශේෂයෙන්ම කිලිනොච්චි සහ මුලතිව් යන දිස්ත්‍රික්වල අවතැන්වූ ජනතාව නැවත පදිංචි කරවූ නිසා අත්හැර දමා ඇති වතු නැවත නඩත්තු කිරීම ආරම්භ කිරීමය. ඒ සමගම මෙම ප්‍රදේශයේ ඇති රජයට අයත් වන මුඩු ඉඩම් රජය විසින් ගොවිපළ ලෙස සංවර්ධනය කිරීම සඳහා මහජනතාව, පුද්ගලික ආයතන සහ රජයේ ආයතනවලට තම අනුග්‍රහය යටතේ ලබා දී ඇත.

වගුඅංක **2:** දිස්ත්‍රික්ක අනුව වතුවල ව්‍යාප්තිය **2002, 2013**

| දිස්ත්‍රික්කය | 2002 | | | 2013 | | |
|---|---|---|---|---|---|---|
| | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | |
| | | අක්කර | හෙක්ටයාර | | අක්කර | හෙක්ටයාර |
| 1.කොළඹ | 67 | 13,195 | 5,340 | 100 | 13,311 | 5,387 |
| 2.ගම්පහ | 404 | 18,951 | 7,669 | 408 | 18,387 | 7,441 |
| 3.කළුතර | 346 | 67,728 | 27,409 | 325 | 65,493 | 26,505 |
| 4.මහනුවර | 323 | 70,421 | 28,499 | 321 | 61,343 | 24,825 |
| 5.මාතලේ | 299 | 43,903 | 17,767 | 271 | 30,247 | 12,241 |
| 6.නුවරඑළිය | 206 | 151,950 | 61,493 | 252 | 142,427 | 57,639 |
| 7.ගාල්ල | 309 | 39,381 | 15,937 | 249 | 37,573 | 15,206 |
| 8.මාතර | 402 | 35,715 | 14,454 | 306 | 34,260 | 13,865 |
| 9.හම්බන්තොට | 141 | 14,265 | 5,773 | 113 | 10,119 | 4,095 |
| 10.යාපනය | 0 | 0 | 0 | 5 | 313 | 127 |
| 11.කිළිනොච්චිය | 1 | 40 | 16 | 212 | 10,891 | 4,408 |
| 12.මන්නාරම | 0 | 0 | 0 | 6 | 1,299 | 526 |
| 13.වව්නියාව | 0 | 0 | 0 | 7 | 229 | 93 |
| 14.මුලතිව් | 0 | 0 | 0 | 29 | 1,215 | 492 |
| 15.මඩකලපුව | 12 | 1,239 | 501 | 40 | 3,212 | 1,300 |
| 16.අම්පාර | 1 | 469 | 190 | 23 | 2,444 | 989 |
| 17.ත්‍රිකුණාමලය | දිස්ත්‍රික්කයේ වතු නොමැත | | | | | |
| 18.කුරුණෑගල | 2,017 | 121,804 | 49,293 | 1,783 | 101,687 | 41,152 |
| 19.පුත්තලම | 943 | 55,758 | 22,565 | 1,239 | 58,736 | 23,770 |
| 20.අනුරාධපුරය | 23 | 5,807 | 2,350 | 55 | 7,452 | 3,016 |
| 21.පොලොන්නරුව | 22 | 9,764 | 3,951 | 59 | 8,557 | 3,463 |
| 22.බදුල්ල | 186 | 101,017 | 40,881 | 207 | 76,073 | 30,786 |
| 23.මොණරාගල | 23 | 11,288 | 4,568 | 95 | 13,941 | 5,642 |
| 24.රත්නපුර | 506 | 97,595 | 39,496 | 554 | 83,694 | 33,870 |
| 25.කෑගල්ල | 346 | 90,657 | 36,688 | 343 | 83,163 | 33,656 |
| ශ්‍රීලංකාව | **6,577** | **950,947** | **384,843** | **7,002** | **866,066** | **350,492** |


**4.1.3: වතු යටතේ බිම් ප්‍රමාණයෙහි ව්‍යාප්තිය**

වතු යටතේ වාර්තාවී ඇති මුළු බිම් ප්‍රමාණය සැලකිල්ලට ගතහොත් 2013 වර්ෂයේ වාර්තාවී ඇති මුළු බිම් ප්‍රමාණය අක්කර 866,066කි. මෙම බිම් ප්‍රමාණය 1982 කෘෂිකර්ම සංගණනයේදී අක්කර 1,330,032 ලෙස ද 2002 කෘෂිකර්ම සංගණනයේදී අක්කර 950,947ක් ලෙස ද වාර්තාවී ඇත. මේ අනුව ශ්‍රී ලංකාවේ වතු යටතේ ඇති බිම් ප්‍රමාණය අඛණ්ඩව අඩුවී යන ස්වරූපයක් දක්නට ලැබේ. වතු යටතේ ඇති බිම් ප්‍රමාණය 2002 වසර හා සැසඳීමේදී 2013 වර්ෂයේ දී මෙම බිම් ප්‍රමාණය අක්කර 84,881කින් එනම් 9%කින් පහත වැටී ඇත.

පසුගිය සංගණනය වසර (2002) සමග සසඳන විට 2013 වතු සංඛ්‍යාව වැඩිවී ඇතත් වතු යටතේ ඇති බිම් ප්‍රමාණය පහත වැටීමට ප්‍රධාන හේතුව විශාල බිම් ප්‍රමාණයක් සහිත වතු නාගරීකරණය යටතේ විශාල ලෙස නිවාස පහසුකම් සහ යටිතල පහසුකම් ඇති කිරීම සඳහා කැබලිවලට බෙදීම විය හැක. වතු යටතේ ඇති බිම් ප්‍රමාණයේ විශාල පහත වැටීමක් සිදුව ඇත්තේ බදුල්ල දිස්ත්‍රික්යේයි. එම දිස්ත්‍රික්කයේ 2002 වර්ෂයේ කෘෂිකර්ම සංගණනයේ දී අක්කර 101,017 ලෙස වාර්තාවී ඇති වතු බිම් ප්‍රමාණය 2013 ආර්ථික සංගණනයේදී අක්කර 76,073 ලෙස වාර්තාවී ඇත. මෙම සංඛ්‍යාව අක්කර 24,944 කින් එනම් 24.5 % කින් අඩුවීමකි. මීලඟට වැඩිම වතු සංඛ්‍යාව අඩුවීමක් වාර්තාවී ඇති කුරුණෑගල දිස්ත්‍රික්කයේය. එම දිස්ත්‍රික්කයේ වතු යටතේ ඇති බිම් ප්‍රමාණය 2002 කෘෂිකර්ම සංගණනයේ දී අක්කර 121,804 ක් ලෙස වාර්තාවී ඇති අතර 2013 වර්ෂයේ අක්කර 101,687 ක් ලෙස පහත වැටී ඇත. එනම් අක්කර 20,117 කින් පහත වැටී ඇත. මෙම පහත වැටීම 16.52% ක් වේ. මාතලේ දිස්ත්‍රික්කයේ 2002 වර්ෂයේ අක්කර 43,903 ක් ලෙස වාර්තාවූ බිම් ප්‍රමාණය 2013 වර්ෂයේ දී අක්කර 30,214 ලෙස ද රත්නපුර දිස්ත්‍රික්කයේ 2002 වර්ෂයේ අක්කර 97,549ක් ලෙස වාර්තාවූ බිම් ප්‍රමාණය 2013 වර්ෂයේ දී අක්කර 84,017 ක් ලෙසද නුවරඑළිය දිස්ත්‍රික්කයේ 2002 වර්ෂයේ දී 151,950 ක් ලෙස වාර්තාවූ බිම් ප්‍රමාණය 2013 වර්ෂයේ දී 142,427 ක් ලෙස ද මුළු බිම් ප්‍රමාණයේ අඩුවීමක් දක්නට ලැබේ. එය ප්‍රතිශතයක් වශයෙන් අනුපිළිවෙලින් 31.3%, 13.91%, 6.27% කි. පසුගිය සංගණන වර්ෂය (2002) සමග සසඳන විට වතු යටතේ බිම් ප්‍රමාණය අඩුවී ඇති සෙසු දිස්ත්‍රික්ක ලෙස ගම්පහ, කළුතර, මහනුවර, ගාල්ල, මාතර, හම්බන්තොට යන දිස්ත්‍රික්ක දැක්විය හැක. (වගු අංක2)

පසුගිය සංගණන වර්ෂය (2002) සමග සසඳන විට වතු යටතේ බිම් ප්‍රමාණය සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩිවූ දිස්ත්‍රික්කය ලෙස කිලිනොච්චි දිස්ත්‍රික්කය වාර්තාවී ඇත. පසුගිය සංගණන වසර (2002) වර්ෂයේ දී අක්කර 40 ක් ලෙස වාර්තාවී ඇති මෙම බිම් ප්‍රමාණය 2013 වර්ෂයේ දී අක්කර 10,891 ක් ලෙස වාර්තා වී ඇත. මීට ප්‍රධාන හේතුව කලින් සඳහන් කළ පරිදි අයහපත් වාතාවරණය නිසා අත්හැර ගිය ප්‍රදේශවල නැවත පදිංචි වීමට අවසර ලබාදීම නිසා අත්හැර දමාතිබූ වතු නැවතත් ජනතාව විසින් නඩත්තු කිරීම ආරම්භ කිරීමයි. වතු යටතේ ඇති බිම් ප්‍රමාණය වැඩිවූ සෙසු දිස්ත්‍රික්ක ලෙස කොළඹ, යාපනය, මන්නාරම, වව්නියාව, මුලතිව්, මඩකලපුව, අම්පාර, පුත්තලම, අනුරාධපුර සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්ක සඳහන් කළ හැක. (වගු අංක2)

## රූප සටහන 1 : දිස්ත්‍රික්ක අනුව වතු ගණන හා වතු යටතේ ඇති බිම් ප්‍රමාණය




ස්ථම්භවලට යටින් දන්වා ඇත්තේ වතු ගනනයි

එකම කාරක තත්ත්වයක් එකම භුක්තියක් යටතේ අවම වශයෙන් එක් බිම් කැබැල්ලක් හෝ අක්කර 20 ක් වන හෝ ඊට වැඩි ගොවි කාණ්ඩයක් වත්තක් ලෙස හැඳින්වේ

### 4.2: විශාලත්වය අනුව වතු ව්‍යාප්තිය

වතු ලැයිස්තු ගත කිරීමේ අදියරේදී වාර්තා වූ වතු සංඛ්‍යාව හා බිම් ප්‍රමාණය, දිස්ත්‍රික්කය හා විශාලත්වය අනුව වගු අංක 3හි දක්වා ඇත.

**වගුඅංක 3:දිස්ත්‍රික්කය හා විශාලත්වය අනුව වතු සංඛ්‍යාව හා බිම් ප්‍රමාණය (අක්කර)**

| දිස්ත්‍රික්කය | මුළු වතු ගණන | අක්කර 50ට අඩු | | අක්කර 50-100ට අඩු | | අක්කර100-250ටඅඩු | | අක්කර 250ට වැඩි | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | වතු ගණන | බිම් ප්‍රමාණය (අක්කර) | වතු ගණන | බිම් ප්‍රමාණය (අක්කර) | වතු ගණන | බිම් ප්‍රමාණය (අක්කර) | වතු ගණන | බිම් ප්‍රමාණය (අක්කර) |
| 1.කොළඹ | 100 | 57 | 1,568 | 25 | 1,493 | 5 | 789 | 13 | 9,461 |
| 2.ගම්පහ | 408 | 318 | 9,565 | 64 | 3,885 | 22 | 3,079 | 4 | 1,858 |
| 3.කළුතර | 325 | 194 | 6,897 | 67 | 4,243 | 23 | 4,719 | 41 | 49,634 |
| 4.මහනුවර | 321 | 167 | 5,188 | 71 | 4,118 | 36 | 5,706 | 47 | 46,332 |
| 5.මාතලේ | 271 | 167 | 5,102 | 55 | 3,523 | 24 | 3,729 | 25 | 17,893 |
| 6.නුවරඑළිය | 252 | 46 | 1,479 | 40 | 2,602 | 21 | 3,255 | 145 | 135,091 |
| 7.ගාල්ල | 249 | 180 | 5,474 | 38 | 2,542 | 12 | 1,839 | 19 | 27,718 |
| 8.මාතර | 306 | 212 | 6,526 | 64 | 3,996 | 16 | 2,031 | 14 | 21,707 |
| 9.හම්බන්තොට | 113 | 78 | 2,317 | 21 | 1,313 | 8 | 1,208 | 6 | 5,281 |
| 10.යාපනය | 5 | 1 | 30 | 3 | 183 | 1 | 100 | 0 | 0 |
| 11.කිළිනොච්චිය | 212 | 154 | 4,927 | 41 | 2,569 | 14 | 1,936 | 3 | 1,459 |
| 12.මන්නාරම | 6 | 2 | 48 | 2 | 100 | 1 | 151 | 1 | 1,000 |
| 13.වව්නියාව | 7 | 6 | 161 | 1 | 68 | 0 | 0 | 0 | 0 |
| 14.මුලතිව් | 29 | 20 | 495 | 5 | 270 | 4 | 450 | 0 | 0 |
| 15.මඩකලපුව | 40 | 35 | 1,054 | 0 | 0 | 2 | 258 | 3 | 1,900 |
| 16.අම්පාර | 23 | 14 | 383 | 5 | 290 | 2 | 302 | 2 | 1,469 |
| 17.ත්‍රිකුණාමලය | | දිස්ත්‍රික්කයේ වතු නොමැත | | | | | | | |
| 18.කුරුණෑගල | 1,783 | 1,276 | 38,606 | 363 | 21,929 | 102 | 13,966 | 42 | 27,186 |
| 19.පුත්තලම | 1,239 | 980 | 27,767 | 188 | 11,049 | 50 | 7,275 | 21 | 12,645 |
| 20.අනුරාධපුරය | 55 | 36 | 989 | 5 | 352 | 6 | 981 | 8 | 5,130 |
| 21.පොළොන්නරුව | 59 | 34 | 1,211 | 11 | 583 | 9 | 1,250 | 5 | 5,513 |
| 22.බදුල්ල | 207 | 76 | 2,465 | 42 | 2,576 | 13 | 2,205 | 76 | 68,827 |
| 23.මොණරාගල | 95 | 57 | 1,594 | 15 | 864 | 11 | 1,609 | 12 | 9,874 |
| 24.රත්නපුර | 554 | 341 | 9,896 | 118 | 7,135 | 33 | 4,953 | 62 | 61,710 |
| 25.කෑගල්ල | 343 | 168 | 5,299 | 91 | 5,635 | 30 | 5,373 | 54 | 66,856 |
| **ශ්‍රීලංකාව** | **7,002** | **4,619** | **139,041** | **1,335** | **81,318** | **445** | **67,164** | **603** | **578,544** |

**වගුඅංක 3.1:දිස්ත්‍රික්කය හා විශාලත්වය අනුව වතු සංඛ්‍යාව හා බිම් ප්‍රමාණය (හෙක්ටයාර)**

| දිස්ත්‍රික්කය | මුළු වතු ගණන | හෙක්ටයාර 20.23 ට අඩු | | හෙක්ටයාර 20.23 - 40.46 ට අඩු | | හෙක්ටයාර 40.46 - 101.17 ට අඩු | | හෙක්ටයාර 101.17 ට වැඩි | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | වතු ගණන | බිම් ප්‍රමාණය (හෙක්.) | වතු ගණන | බිම් ප්‍රමාණය (හෙක්.) | වතු ගණන | බිම් ප්‍රමාණය (හෙක්.) | වතු ගණන | බිම් ප්‍රමාණය (හෙක්.) |
| 1.කොළඹ | 100 | 57 | 635 | 25 | 604 | 5 | 319 | 13 | 3,829 |
| 2.ගම්පහ | 408 | 318 | 3,871 | 64 | 1,572 | 22 | 1,246 | 4 | 752 |
| 3.කළුතර | 325 | 194 | 2,791 | 67 | 1,717 | 23 | 1,910 | 41 | 20,087 |
| 4.මහනුවර | 321 | 167 | 2,100 | 71 | 1,667 | 36 | 2,309 | 47 | 18,750 |
| 5.මාතලේ | 271 | 167 | 2,065 | 55 | 1,426 | 24 | 1,509 | 25 | 7,241 |
| 6.නුවරඑළිය | 252 | 46 | 599 | 40 | 1,053 | 21 | 1,317 | 145 | 54,671 |
| 7.ගාල්ල | 249 | 180 | 2,215 | 38 | 1,029 | 12 | 744 | 19 | 11,217 |
| 8.මාතර | 306 | 212 | 2,641 | 64 | 1,617 | 16 | 822 | 14 | 8,785 |
| 9.හම්බන්තොට | 113 | 78 | 938 | 21 | 531 | 8 | 489 | 6 | 2,137 |
| 10.යාපනය | 5 | 1 | 12 | 3 | 74 | 1 | 40 | 0 | 0 |
| 11.කිළිනොච්චිය | 212 | 154 | 1,994 | 41 | 1,040 | 14 | 783 | 3 | 590 |
| 12.මන්නාරම | 6 | 2 | 19 | 2 | 40 | 1 | 61 | 1 | 405 |
| 13.වව්නියාව | 7 | 6 | 65 | 1 | 28 | 0 | 0 | 0 | 0 |
| 14.මුලතිව් | 29 | 20 | 200 | 5 | 109 | 4 | 182 | 0 | 0 |
| 15.මඩකලපුව | 40 | 35 | 427 | 0 | 0 | 2 | 104 | 3 | 769 |
| 16.අම්පාර | 23 | 14 | 155 | 5 | 117 | 2 | 122 | 2 | 594 |
| 17.ත්‍රිකුණාමලය | | දිස්ත්‍රික්කයේ වතු නොමැත | | | | | | | |
| 18.කුරුණෑගල | 1,783 | 1,276 | 15,624 | 363 | 8,875 | 102 | 5,652 | 42 | 11,002 |
| 19.පුත්තලම | 1,239 | 980 | 11,237 | 188 | 4,471 | 50 | 2,944 | 21 | *5,117* |
| 20.අනුරාධපුරය | 55 | 36 | 400 | 5 | 142 | 6 | 397 | 8 | 2,076 |
| 21.පොලොන්නරුව | 59 | 34 | 490 | 11 | 236 | 9 | 506 | 5 | 2,231 |
| 22.බදුල්ල | 207 | 76 | 998 | 42 | 1,042 | 13 | 892 | 76 | 27,854 |
| 23.මොණරාගල | 95 | 57 | 645 | 15 | 350 | 11 | 651 | 12 | 3,996 |
| 24.රත්නපුර | 554 | 341 | 4,005 | 118 | 2,887 | 33 | 2,004 | 62 | 24,974 |
| 25.කෑගල්ල | 343 | 168 | 2,144 | 91 | 2,280 | 30 | 2,174 | 54 | 27,056 |
| ශ්‍රීලංකාව | 7,002 | **4,619** | **56,269** | **1,335** | **32,909** | **445** | **27,181** | **603** | **234,134** |

වතු ලැයිස්තු ගත කිරීම අනුව වතුවලින් වැඩි ප්‍රමාණයක් වාර්තා වී ඇත්තේ අක්කර 50ට අඩු වතු ලෙසිනි. එය 4,619ක් වන අතර මුළු වතු සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 66% වේ. අක්කර 50 -100 කාණ්ඩය යටතේ වතු 1,335ක් (19%) අක්කර 100 -250කාණ්ඩය යටතේ වතු 445ක් ද (6%) අක්කර 250ට වැඩි වතු 603ක් (9%) ලෙස වාර්තා වී ඇත. (වගු අංක3)


අක්කර 50ට අඩු වතු සංඛ්‍යාවෙන් වැඩි ප්‍රමාණයක් වාර්තා වී ඇත්තේ කුරුණෑගල දිස්ත්‍රික්කයෙනි. එය වතු 1,276කි. එම කාණ්ඩය යටතේ අඩුම වතු සංඛ්‍යාව වාර්තා වී ඇත්තේ යාපනය දිස්ත්‍රික්කයෙනි. එය එක් වත්තකි.

අක්කර 50 -100 කාණ්ඩයට අයත් වතුවලින් ද වැඩිම වතු සංඛ්‍යාව වාර්තා වී ඇත්තේ ද කුරුණෑගල දිස්ත්‍රික්කයෙන්මය. එය වතු 363කි. අක්කර 50 -100 කාණ්ඩයට අයත් වතු කාණ්ඩය යටතේ අඩුම වතු සංඛ්‍යාව වාර්තා වී ඇත්තේ වවුනියාව දිස්ත්‍රික්කයෙනි. එය එක් වත්තකි. අක්කර 100 -250 කාණ්ඩය යටතේ වැඩිම වතු සංඛ්‍යාව වන වතු 102ක් වාර්තා වී ඇත්තේ ද කුරුණෑගල දිස්ත්‍රික්කයෙන්ම වන අතර එම කාණ්ඩයේ අඩුම වතු සංඛ්‍යාව වන එක් වත්තක් බැගින් යාපනය හා මන්නාරම යන දිස්ත්‍රික්ක වලින් වාර්තා වේ. මෙම සීමාව තුල කිසිදු වත්තක් නොමැති දිස්ත්‍රික්ක ලෙස වවුනියාව හා ත්‍රිකුණාමලය දැක්විය හැක.

අක්කර 250ට වැඩි වතු කාණ්ඩය යටතේ වැඩිම වතු සංඛ්‍යාව වන වතු 145ක් නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර අඩුම වතු සංඛ්‍යාව ලෙස එක් වත්තක් මන්නාරමින් වාර්තා වී ඇත. යාපනය, වවුනියාව, මුලතිව් හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්ක වලින් අක්කර 250ට වැඩි වතු කිසිවක් වාර්තා වී නොමැත.


වතු යටතේ වාර්තා වී ඇති බිම් ප්‍රමාණය සැලකිල්ලට ගතහොත් අක්කර 250ට වැඩි වතු යටතේ වැඩිම බිම් ප්‍රමාණයක් වාර්තා වී ඇත. එය අක්කර 578,544 ක් වේ. එය වතු යටතේ ඇති මුළු බිම් ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස 67%වේ. අක්කර 50ට අඩු වතු යටතේ වාර්තා වී ඇති බිම් ප්‍රමාණය අක්කර 139,041 කි. එය මුළු බිම් ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස 16%කි. අක්කර 50 -100 කාණ්ඩයේ වතු යටතේ වාර්තා වී ඇති බිම් ප්‍රමාණය අක්කර 81,318ක් වේ. එය මුළු බිම් ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස දැක්වූ විට 10%කි. අක්කර 100 -250ට අඩු වතු යටතේ වාර්තා වී ඇති බිම් ප්‍රමාණය අක්කර 67,164 ක් වේ. එය මුළු බිම් ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස 8%කි. (වගු අංක3)

## රූප සටහන 2 : වතු සංඛ්‍යාව වතුවල විශාලත්වය සහ දිස්ත්‍රික්කය අනුව





එකම කාරක තත්ත්වයක් එකම භුක්තියක් යටතේ අවම වශයෙන් එක් බිම් කැබැල්ලක් හෝ අක්කර 20 ක් වන හෝ ඊට වැඩි ගොවි කාණ්ඩයක් වත්තක් ලෙස හැඳින්වේ

## රූප සටහන 3 : වතු යටතේ ඇති බිම් ප්‍රමාණය වතුවල විශාලත්වය සහ දිස්ත්‍රික්කය අනුව





එකම කාරක තත්ත්වයක් හා එකම භුක්තියක් යටතේ අවම වශයෙන් එක් බිම් කැබැල්ලක් හෝ අක්කර 20 ක් හෝ ඊට වැඩි ගොවි කාණ්ඩයක් වත්තක් ලෙස හැඳින්වේ.

**රූප සටහන 4: විශාලත්වය අනුව වතු සංඛ්‍යාවෙහි ව්‍යාප්තිය**




**රූප සටහන 5: විශාලත්වය අනුව වතුවල බිම් ප්‍රමාණයේ ව්‍යාප්තිය**



### 4.3: බෝග වගාව අනුව වතුවල ව්‍යාප්තිය

වගාකර ඇති බෝග වර්ගය අනුව වැඩිම වතු සංඛ්‍යාවක් වන වතු 4,363ක් වගා කර ඇත්තේ පොල් වගාව යටතේය. දෙවනුවට තේ වගාව යටතේ වතු 1,676ක් ද තෙවනුවට රබර් වගාව යටතේ වතු 1,344ක් ද වාර්තා වී ඇත. (වගු අංක4) පසුගිය සංගණන වසර (2002) සමඟ සංසන්දනය කරන විට පොල් වතු සංඛ්‍යාව 4,142 සිට 4,363 දක්වා වතු 221කින් ද රබර් වතු 1,331 සිට 1,344 දක්වා වතු 13කින් ද වැඩි වී ඇත. නමුත් තේ වතු සංඛ්‍යාව 1,740 සිට 1,676 දක්වා වතු 64කින් අඩුවී ඇත. පසුගිය සංගණන වර්ෂය හා සැසඳීමේදී රබර් වගා කර ඇති බිම් ප්‍රමාණය අක්කර 159,671 සිට 165,720 දක්වා අක්කර 6,049කින් වැඩිවී ඇත. තේ වගා කර ඇති බිම් ප්‍රමාණය අක්කර 293,938 සිට අක්කර 242,481 දක්වා අක්කර 51,457කින් ද පොල් වගා කර ඇති බිම් ප්‍රමාණය අක්කර 175,883 සිට අක්කර 168,377 දක්වා අක්කර 7,506කින් ද අඩුවීඇත.

**වගුඅංක 4:වතු සංඛ්‍යාව හා බිම් ප්‍රමාණය වගා කර ඇති බෝගය අනුව (අක්කර)**

| දිස්ත්‍රික්කය | තේ වගාව යටතේ | | රබර් වගාව යටතේ | | පොල් වගාව යටතේ | |
|---|---|---|---|---|---|---|
| | වතු ගණන | බිම් ප්‍රමාණය (අක්කර ) | වතු ගණන | බිම් ප්‍රමාණය (අක්කර ) | වතු ගණන | බිම් ප්‍රමාණය (අක්කර ) |
| 1.කොළඹ | 15 | 183 | 73 | 10,300 | 45 | 1,464 |
| 2.ගම්පහ | 1 | 2 | 47 | 1,199 | 391 | 15,099 |
| 3.කළුතර | 136 | 2,960 | 273 | 37,506 | 90 | 1,043 |
| 4.මහනුවර | 211 | 32,731 | 20 | 895 | 56 | 1,197 |
| 5.මාතලේ | 74 | 9,228 | 63 | 2,873 | 134 | 4,137 |
| 6.නුවරඑළිය | 234 | 100,881 | 3 | 57 | 5 | 21 |
| 7.ගාල්ල | 186 | 5,536 | 119 | 9,269 | 98 | 1,513 |
| 8.මාතර | 198 | 10,736 | 105 | 5,143 | 141 | 3,099 |
| 9.හම්බන්තොට | 0 | 0 | 2 | 15 | 94 | 2,338 |
| 10.යාපනය | 0 | 0 | 0 | 0 | 2 | 11 |
| 11.කිළිනොච්චි | 0 | 0 | 0 | 0 | 99 | 2,924 |
| 12.මන්නාරම | 0 | 0 | 0 | 0 | 4 | 125 |
| 13.වවුනියා | 0 | 0 | 2 | 13 | 5 | 10 |
| 14.මුලතිව් | 0 | 0 | 0 | 0 | 29 | 1,215 |
| 15.මඩකළපුව | 0 | 0 | 0 | 0 | 39 | 1,391 |
| 16.අම්පාර | 0 | 0 | 0 | 0 | 17 | 932 |
| 17.ත්‍රිකුණාමලය | දිස්ත්‍රික්කයේ වතු නොමැත | | | | | |
| 18.කුරුණෑගල | 2 | 210 | 58 | 6,447 | 1,741 | 83,388 |
| 19.පුත්තලම | 0 | 0 | 1 | 5 | 1,077 | 41,709 |
| 20.අනුරාධපුරය | 0 | 0 | 1 | 4 | 32 | 474 |
| 21.පොලොන්නරුව | 0 | 0 | 1 | 20 | 38 | 2,561 |
| 22.බදුල්ල | 144 | 50,000 | 54 | 3,994 | 5 | 47 |
| 23.මොණරාගල | 4 | 902 | 24 | 2,941 | 42 | 495 |
| 24.රත්නපුර | 309 | 20,035 | 257 | 28,286 | 97 | 1,172 |
| 25.කෑගල්ල | 162 | 9,077 | 241 | 56,753 | 82 | 2,012 |
| **ශ්‍රී ලංකාව** | **1,676** | **242,481** | **1,344** | **165,720** | **4,363** | **168,377** |

**වගුඅංක 4.1:වතු සංඛ්‍යාව හා බිම් ප්‍රමාණය වගා කර ඇති බෝගය අනුව (හෙක්ටයාර)**

| දිස්ත්‍රික්කය | තේ වගාව යටතේ | | රබර් වගාව යටතේ | | පොල් වගාව යටතේ | |
|---|---|---|---|---|---|---|
| | වතු ගණන | බිම් ප්‍රමාණය (හෙක්.) | වතු ගණන | බිම් ප්‍රමාණය (හෙක්.) | වතු ගණන | බිම් ප්‍රමාණය (හෙක්.) |
| 1.කොළඹ | 15 | 74 | 73 | 4,168 | 45 | 592 |
| 2.ගම්පහ | 1 | 0.8 | 47 | 485 | 391 | 6,110 |
| 3.කළුතර | 136 | 1,198 | 273 | 15,178 | 90 | 422 |
| 4.මහනුවර | 211 | 13,246 | 20 | 362 | 56 | 484 |
| 5.මාතලේ | 74 | 3,734 | 63 | 1,163 | 134 | 1,674 |
| 6.නුවරඑළිය | 234 | 40,826 | 3 | 23 | 5 | 8 |
| 7.ගාල්ල | 186 | 2,240 | 119 | 3,751 | 98 | 612 |
| 8.මාතර | 198 | 4,345 | 105 | 2,081 | 141 | 1,254 |
| 9.හම්බන්තොට | 0 | 0 | 2 | 6 | 94 | 946 |
| 10.යාපනය | 0 | 0 | 0 | 0 | 2 | 4 |
| 11.කිළිනොච්චි | 0 | 0 | 0 | 0 | 99 | 1,183 |
| 12.මන්නාරම | 0 | 0 | 0 | 0 | 4 | 50 |
| 13.වවුනියා | 0 | 0 | 2 | 5 | 5 | 4 |
| 14.මුලතිව් | 0 | 0 | 0 | 0 | 29 | 492 |
| 15.මඩකළපුව | 0 | 0 | 0 | 0 | 39 | 563 |
| 16.අම්පාර | 0 | 0 | 0 | 0 | 17 | 377 |
| 17.ත්‍රිකුණාමලය | දිස්ත්‍රික්කයේ වතු නොමැත | | | | | |
| 18.කුරුණෑගල | 2 | 85 | 58 | 2,609 | 1,741 | 33,747 |
| 19.පුත්තලම | 0 | 0 | 1 | 2 | 1,077 | 16,879 |
| 20.අනුරාධපුරය | 0 | 0 | 1 | 2 | 32 | 192 |
| 21.පොලොන්නරුව | 0 | 0 | 1 | 8 | 38 | 1,036 |
| 22.බදුල්ල | 144 | 20,235 | 54 | 1,616 | 5 | 19 |
| 23.මොණරාගල | 4 | 365 | 24 | 1,190 | 42 | 200 |
| 24.රත්නපුර | 309 | 8,108 | 257 | 11,447 | 97 | 474 |
| 25.කෑගල්ල | 162 | 3,673 | 241 | 22,968 | 82 | 814 |
| **ශ්‍රී ලංකාව** | **1,676** | **98,131** | **1,344** | **67,066** | **4,363** | **68,141** |

### 4.3.1:පොල් වගාව යටතේ ඇති වතු වලව්‍යාප්තිය

පොල් වගාව යටතේ 2002 සහ 2013 සංගණන වලදී වාර්තා වූ වතු සංඛ්‍යාව සහ බිම් ප්‍රමාණය වගු අංක 5හි දක්වා ඇත.

**වගුඅංක 5:පොල් වගාව අනුව වතු සංඛ්‍යාව සහ බිම් ප්‍රමාණය 2002 ,2013**

| දිස්ත්‍රික්කය | 2002 | | | 2013 | | |
|---|---|---|---|---|---|---|
| | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | |
| | | අක්කර | හෙක්ටයාර | | අක්කර | හෙක්ටයාර |
| 1.කොළඹ | 38 | 1,047 | 424 | 45 | 1,464 | 592 |
| 2.ගම්පහ | 383 | 15,223 | 6,161 | 391 | 15,099 | 6,110 |
| 3.කළුතර | 105 | 1,467 | 594 | 90 | 1,043 | 422 |
| 4.මහනුවර | 55 | 1,625 | 658 | 56 | 1,197 | 484 |
| 5.මාතලේ | 122 | 4,882 | 1,976 | 134 | 4,137 | 1,674 |
| 6.නුවරඑළිය | 4 | 18 | 7 | 5 | 21 | 8 |
| 7.ගාල්ල | 120 | 2,161 | 875 | 98 | 1,513 | 612 |
| 8.මාතර | 161 | 2,659 | 1,076 | 141 | 3,099 | 1,254 |
| 9.හම්බන්තොට | 110 | 3,133 | 1,268 | 94 | 2,338 | 946 |
| 10.යාපනය | 0 | 0 | 0 | 2 | 11 | 4 |
| 11.කිළිනොච්චිය | 1 | 30 | 12 | 99 | 2,924 | 1,183 |
| 12.මන්නාරම | 0 | 0 | 0 | 4 | 125 | 51 |
| 13.වව්නියාව | 0 | 0 | 0 | 5 | 10 | 4 |
| 14.මුලතිව් | 0 | 0 | 0 | 29 | 1,215 | 492 |
| 15.මඩකලපුව | 8 | 588 | 238 | 39 | 1,391 | 563 |
| 16.අම්පාර | 1 | 118 | 48 | 17 | 932 | 377 |
| 17.ත්‍රිකුණාමලය | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 18.කුරුණෑගල | 1,944 | 93,630 | 37,892 | 1,741 | 83,388 | 33,747 |
| 19.පුත්තලම | 835 | 42,352 | 17,140 | 1,077 | 41,709 | 16,879 |
| 20.අනුරාධපුරය | 10 | 699 | 283 | 32 | 474 | 192 |
| 21.පොලොන්නරුව | 14 | 2,039 | 825 | 38 | 2,561 | 1,036 |
| 22.බදුල්ල | 2 | 82 | 33 | 5 | 47 | 19 |
| 23.මොණරාගල | 10 | 447 | 181 | 42 | 495 | 200 |
| 24.රත්නපුර | 114 | 1,708 | 691 | 97 | 1,172 | 474 |
| 25.කෑගල්ල | 105 | 1,975 | 799 | 82 | 2,012 | 814 |
| **ශ්‍රීලංකාව** | **4,142** | **175,883** | **71,179** | **4,363** | **168,377** | **68,141** |

පොල් වගාව යටතේ වගා කර ඇති මුළු වතු සංඛ්‍යාව 4,363කි. මෙය පසුගිය සංගණන වසර හා සැසදීමේදී 5%ක වැඩිවීමකි. පොල් වතු වැඩි සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ කුරුණෑගල දිස්ත්‍රික්කයෙන්ය. එය වතු 1,741ක් වේ. පසුගිය සංගණන වර්ෂය හා සැසදීමේදී එය වතු 1,944 සිට 1,741 දක්වා අඩු වීමක් පෙන්නුම් කර ඇත. දෙවනුවට වැඩිම පොල් වතු සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ පුත්තලම දිස්ත්‍රික්කයෙනි. එය 1,077ක් වන අතර 2002 වර්ෂයේ කෘෂිකර්ම සංගණනයේ පොල් වතු සංඛ්‍යාව සමඟ සංසන්දනය කිරීමේදී මෙවර එම දිස්ත්‍රික්කයේ පොල් වතුවල වැඩිවීමක් වාර්තා වී ඇත. එය වතු 835 සිට 1,077 දක්වා වතු 242ක වැඩිවීමකි. මෙම දිස්ත්‍රික්කයන් හැරුණු විට 100ට වැඩි වතු සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ ගම්පහ, මාතර සහ මාතලේ යන දිස්ත්‍රික්කවලය. (වගු අංක 5)

50 -100 අතර පොල් වතු සංඛ්‍යාවක් කළුතර, කිළිනොච්චිය, කෑගල්ල, ගාල්ල, මහනුවර, රත්නපුර සහ හම්බන්තොට යන දිස්ත්‍රික්කවලින් වාර්තා වී ඇත. 50ට අඩු පොල් වතු සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ කොළඹ, මොණරාගල, මඩකලපුව, පොළොන්නරුව, අනුරාධපුරය, මුලතිව්, අම්පාර, වවුනියාව, නුවරඑළිය, බදුල්ල, මන්නාරම සහ යාපනය යන දිස්ත්‍රික්කවලිනි.


පසුගිය සංගණන වර්ෂය (2002) සමඟ සංසන්දනය කරන විට කිළිනොච්චි දිස්ත්‍රික්කයේ වූ පොල් වතු මෙවර විශාල වශයෙන් වැඩිවී ඇත. පසුගිය සංගණන වර්ෂය (2002) සමඟ සසඳන විට පොල් වතු සංඛ්‍යාව වැඩි වී ඇති සෙසු දිස්ත්‍රික්කවන යාපනය 0 සිට 2 දක්වා ද, මන්නාරම 0 සිට 4 දක්වා ද, වවුනියාව 0 සිට 5 දක්වාද, මුලතිව් 0 සිට 29 දක්වා ද, අම්පාර 1 සිට 17 දක්වා ද, බදුල්ල 2 සිට 5 දක්වා ද, නුවරඑළිය 4 සිට 5 දක්වා ද, මඩකලපුව 8 සිට 39 දක්වා ද, අනුරාධපුර 10 සිට 32 දක්වා ද, මොණරාගල 10 සිට 42 දක්වා ද, පොළොන්නරුව 14 සිට 38 දක්වා ද, කොළඹ 38 සිට 45 දක්වා ද. මහනුවර 55 සිට 56 දක්වා ද, මාතලේ 122 සිට 134 දක්වා ද වැඩි වී ඇති ආකාරය පැහැදිලි වේ. (වගු අංක 5)

පසුගිය සංගණන වර්ෂයට සාපේක්ෂව මෙවර කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට, රත්නපුර, කෑගල්ල යන දිස්ත්‍රික්කයන්හි පොල් වතු සංඛ්‍යාවේ අඩුවීමක් වාර්තා වී ඇත. එම අඩුවීම පිළිවෙලින් පොල් වතු 105 සිට 90 දක්වා ද, 120 සිට 98 දක්වා ද, 161 සිට 141 දක්වා ද, 110 සිට 99 දක්වා ද, 114 සිට 97 දක්වා ද, 105 සිට 82 දක්වා ද වේ.

බිම් ප්‍රමාණය සැලකීමේ දී පොල් වගා කරන දිස්ත්‍රික්කවලින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඩි බිම් ප්‍රමාණයක් වාර්තා වී ඇත. එය අක්කර 83,388ක් වේ. නමුත් 2002 වර්ෂයේ කෘෂිකර්ම සංගණනයේ දී කුරුණෑගල දිස්ත්‍රික්කයෙහි පොල් වගා කළ බිම් ප්‍රමාණය අක්කර 93,698ක් ලෙස වාර්තා වී ඇති අතර අක්කර 10,000කට වැඩි බිම් ප්‍රමාණයක් මෙවර පොල් වගාවෙන් ඉවත් වී ඇත. කුරුණෑගල හැරුණු විට පුත්තලමෙහි අක්කර 41,709ක් ද ගම්පහ අක්කර 15,098ක් ද වාර්තා වී ඇති අතර අනෙක් දිස්ත්‍රික්කවල අක්කර 5,000ට අඩු බිම් ප්‍රමාණයන්පොල් වගාව යටතේ වාර්තා වී ඇත. (වගු අංක 5)

මෙවර පොල් වතු සංඛ්‍යාව 2002 වර්ෂයේ කෘෂිකර්ම සංගණනයට සාපේක්ෂව වැඩි වුවද පොල් වගා කර ඇති බිම් ප්‍රමාණය පහත වැටී තිබීම සුවිශේෂීතාවයකි. බිම් ප්‍රමාණය මෙලෙස පහත වැටීමට ප්‍රධාන හේතුව ලෙස දැක්විය හැක්කේ පොල් වගා කරන ප්‍රධාන දිස්ත්‍රික්ක දෙක වන කුරුණෑගල සහ පුත්තලම යන දිස්ත්‍රික්කවල පොල් ඉඩම් කැබලි කර වෙනත් කටයුතු සඳහා යොදා ගැනීම විය හැක.

## රූප සටහන 6 : දිස්ත්‍රික්ක අනුව පොල් වගා කර ඇති පොල් වතු ගණන හා පොල් වතු යටතේ ඇති බිම් ප්‍රමාණය




ස්ථම්භ වලට යටින් දක්වා ඇත්තේ තේ වතු ගණනයි.
එකම කාරක තත්ත්වයක් හා එකම භුක්තියක් යටතේ අවම වශයෙන් එක් බිම් කැබැල්ලක් හෝ අක්කර 20 ක් හෝ ඊට වැඩි ගොවි කාණ්ඩයක් වත්තක් ලෙස හැඳින්වේ.

### 4.3.2: තේ වගාව යටතේ ඇති වතු වලව්‍යාප්තිය

තේවගාව යටතේ 2002 සහ 2013 සංගණන වලදී වාර්තා වූ වතු සංඛ්‍යාව සහ බිම් ප්‍රමාණය වගු අංක 6හි දක්වා ඇත.

**වගුඅංක 6:තේ වගාව අනුව වතු සංඛ්‍යාව සහ බිම් ප්‍රමාණය 2002, 2013**

| දිස්ත්‍රික්කය | 2002 | | | 2013 | | |
|---|---|---|---|---|---|---|
| | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | |
| | | අක්කර | හෙක්ටයාර | | අක්කර | හෙක්ටයාර |
| 1.කොළඹ | 7 | 149 | 60 | 15 | 183 | 74 |
| 2.ගම්පහ | 0 | 0 | 0 | 1 | 2 | 0.8 |
| 3.කළුතර | 78 | 2,603 | 1,053 | 136 | 2,960 | 1,198 |
| 4.මහනුවර | 235 | 37,041 | 14,990 | 211 | 32,731 | 13,246 |
| 5.මාතලේ | 87 | 11,796 | 4,774 | 74 | 9,228 | 3,734 |
| 6.නුවරඑළිය | 195 | 114,214 | 46,222 | 234 | 100,881 | 40,826 |
| 7.ගාල්ල | 235 | 8,816 | 3,568 | 186 | 5,536 | 2,240 |
| 8.මාතර | 289 | 15,760 | 6,378 | 198 | 10,736 | 4,345 |
| 9.හම්බන්තොට | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 10.යාපනය | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 11.කිළිනොච්චිය | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 12.මන්නාරම | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 13.වව්නියාව | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 14.මුලතිව් | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 15.මඩකලපුව | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 16.අම්පාර | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 17.ත්‍රිකුණාමලය | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 18.කුරුණෑගල | 1 | 24 | 10 | 2 | 210 | 85 |
| 19.පුත්තලම | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 20.අනුරාධපුරය | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 21.පොළොන්නරුව | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 22.බදුල්ල | 161 | 61,833 | 25,023 | 144 | 50,000 | 20,235 |
| 23.මොණරාගල | 7 | 2,105 | 852 | 4 | 902 | 365 |
| 24.රත්නපුර | 331 | 31,921 | 12,918 | 309 | 20,035 | 8,108 |
| 25.කෑගල්ල | 114 | 7,676 | 3,106 | 162 | 9,077 | 3,673 |
| **ශ්‍රීලංකාව** | **1,740** | **293,938** | **118,955** | **1,676** | **242,481** | **98,131** |


තේ වගාව යටතේ වගා කර ඇති මුළු වතු සංඛ්‍යාව 1,676කි. මෙය පසුගිය සංගණන වසර හා සැසඳීමේදී 4% අඩු වීමකි. වැඩිම තේ වතු වැඩි සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ රත්නපුර දිස්ත්‍රික්කයේය. එය 309 ක් වේ. පසුගිය සංගණන වසර (2002) සමඟ සසඳන විට මෙම දිස්ත්‍රික්කයේ තේ වතු සංඛ්‍යාව 331 සිට 309 දක්වා අඩුවීමක් ද පෙන්නුම් කර ඇත. දෙවනුවට වැඩි වශයෙන් තේ වගා කර ඇති නුවරඑළිය දිස්ත්‍රික්කයේ තේ වතු 234 ක් වාර්තා වී ඇත. මෙයට අමතරව මහනුවර 198ක් ද, ගාල්ල 186 ක් ද කෑගල්ල 162 ක් ද ලෙසින් තේ වතු වාර්තා වී ඇත. බදුල්ල දිස්ත්‍රික්කයේ තේ වතු 144 ක් වාර්තා වී ඇති අතර කළුතර දිස්ත්‍රික්කයේ එය 134ක් ලෙස වාර්තා වී ඇත. මාතලේ දිස්ත්‍රික්කයේ තේ වතු ගණන 74කි. මොණරාගල, කුරුණෑගල සහ ගම්පහ දිස්ත්‍රික්කවල පිළිවෙලින් 4, 2, 1 ක් ලෙස තේ වතු සංඛ්‍යාවක් වාර්තා වී ඇති අතර අනුරාධපුරය, අම්පාර, කිළිනොච්චි, ත්‍රිකුණාමලය, පුත්තලම, පොළොන්නරුව, මන්නාරම, මඩකලපුව, මුලතිව්, යාපනය, වව්නියාව සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල තේ වතු වාර්තාවී නොමැත. (වගු අංක6)

වගා කර ඇති බෝග වර්ගය අනුව බිම් ප්‍රමාණය සැලකිල්ලට ගතහොත් වැඩිම බිම් ප්‍රමාණයක් වාර්තා වී ඇත්තේ තේ වගාව යටතේය. එය අක්කර 242,481 ක් වේ. නමුත් 2002 වර්ෂයේ කෘෂිකර්ම සංගණනය සමඟ සසඳන විට මෙහි බිම් ප්‍රමාණයේ කැපී පෙනෙන අඩුවීමක් දක්නට ලැබේ. එම අඩුවීම අක්කර 51,457 ක් වන අතර 17% ක ප්‍රතිශතයකි. දිස්ත්‍රික්ක අනුව තේ වගා කල බිම් ප්‍රමාණය සැලකිල්ලට ගතහොත් වැඩි අක්කර ප්‍රමාණයක් වාර්තා වී ඇත්තේ නුවරඑළිය දිස්ත්‍රික්කයේය. එය අක්කර 100,881 ක් වේ. පසුගිය කෘෂිකර්ම සංගණනයේදී (2002) එය අක්කර 125,924 ක් වු අතර එම වසර හා සැසදිමේදී මෙවර එහි අඩුවීම අක්කර25,043 කි.

ඒ හැරුණු විට බදුල්ල දිස්ත්‍රික්කයේ අක්කර 50,000 ක් තේ වගාව යටතේ වාර්තා වී ඇත. මහනුවර (අක්කර 32,731) , රත්නපුර (අක්කර 20,035), මාතර (අක්කර 10,736), මාතලේ (අක්කර 9,228), කෑගල්ල (අක්කර 9,077), ගාල්ල (අක්කර 5,536) සහ කළුතර (අක්කර 2,960) යන දිස්ත්‍රික්කවල තේ වගා කර ඇත. මොණරාගල (අක්කර 902), කුරුණෑගල (අක්කර 210), කොළඹ (අක්කර 183) සහ ගම්පහ (අක්කර 02) හැරුණු විට අනෙක් දිස්ත්‍රික්ක වලින් තේ වගා කල බිම් වාර්තා නොවේ. (වගුඅංක6)

තේ වතු සංඛ්‍යාව සහ තේ වගාව යටතේ ඇති බිම් ප්‍රමාණය මෙලෙස පහත වැටීමට, තේ වතු කැබලි වීම, නාගරීකරණය නිසා තේ වගා කළ බිම් ඒ සඳහා භාවිතා කිරීම සහ වෙනත් වැඩි ආර්ථික වටිනාකමක් ලැබෙන බෝග වලට තේ වගා කළ ඉඩම් ආදේශ කරගැනීම යන කරුණු හේතු වී ඇත.

## රූප සටහන 7 : දිස්ත්‍රික්ක අනුව තේ වතු ගණන හා තේ වතු යටතේ ඇති බිම් ප්‍රමාණය




ස්ථම්භ වලට යටින් දක්වා ඇත්තේ තේ වතු ගණනයි.
එකම කාරක තත්ත්වයක් හා එකම භුක්තියක් යටතේ අවම වශයෙන් එක් බිම් කැබැල්ලක් හෝ අක්කර 20 ක් හෝ ඊට වැඩි ගොවි කාණ්ඩයක් වත්තක් ලෙස හැඳින්වේ.

### 4.3.3: රබර් වගාව යටතේ වතුවල ව්‍යාප්තිය: 2002, 2013

රබර් වගාව යටතේ 2002 සහ 2013 සංගණන වලදී වාර්තා වූ වතු සංඛ්‍යාව සහ බිම් ප්‍රමාණය වගු අංක 7හි දක්වා ඇත.


**වගුඅංක 7:රබර් වගාව අනුව වතු සංඛ්‍යාව සහ බිම් ප්‍රමාණය 2002 , 2013**

| දිස්ත්‍රික්කය | 2002 | | | 2013 | | |
|---|---|---|---|---|---|---|
| | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | |
| | | අක්කර | හෙක්ටයාර | | අක්කර | හෙක්ටයාර |
| 1.කොළඹ | 46 | 9,462 | 3829 | 73 | 10,300 | 4168 |
| 2.ගම්පහ | 55 | 1,102 | 446 | 47 | 1,199 | 485 |
| 3.කළුතර | 290 | 40,993 | 16590 | 273 | 37,506 | 15178 |
| 4.මහනුවර | 18 | 500 | 202 | 20 | 895 | 362 |
| 5.මාතලේ | 59 | 4,179 | 1691 | 63 | 2,873 | 1163 |
| 6.නුවරඑළිය | 1 | 5 | 2 | 3 | 57 | 23 |
| 7.ගාල්ල | 137 | 11,987 | 4851 | 119 | 9,269 | 3751 |
| 8.මාතර | 121 | 5,344 | 2163 | 105 | 5,143 | 2081 |
| 9.හම්බන්තොට | 1 | 5 | 2 | 2 | 15 | 6 |
| 10.යාපනය | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 11.කිළිනොච්චිය | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 12.මන්නාරම | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 13.වව්නියාව | 0 | 0 | 0 | 2 | 13 | 5 |
| 14.මුලතිව් | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 15.මඩකලපුව | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 16.අම්පාර | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 17.ත්‍රිකුණාමලය | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 18.කුරුණෑගල | 53 | 1,944 | 787 | 58 | 6,447 | 2,609 |
| 19.පුත්තලම | 0 | 0 | 0 | 1 | 5 | 2 |
| 20.අනුරාධපුරය | 0 | 0 | 0 | 1 | 4 | 2 |
| 21.පොලොන්නරුව | 0 | 0 | 0 | 1 | 20 | 8 |
| 22.බදුල්ල | 13 | 908 | 367 | 54 | 3,994 | 1,616 |
| 23.මොණරාගල | 10 | 3,212 | 1,300 | 24 | 2,941 | 1,190 |
| 24.රත්නපුර | 267 | 29,991 | 12,137 | 257 | 28,286 | 11,447 |
| 25.කෑගල්ල | 260 | 50,039 | 20,250 | 241 | 56,753 | 22,968 |
| **ශ්‍රීලංකාව** | **1,331** | **159,671** | **64,618** | **1,344** | **165,720** | **67,066** |

රබර් වගාව යටතේ වගා කර ඇති මුළු වතු සංඛ්‍යාව 1,344කි. මෙය පසුගිය සංගණන වසර හා සැසඳීමේදී 1% වැඩි වීමකි. රබර් වගා කර ඇති වතු වලින් වැඩිම වතු සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ කළුතර දිස්ත්‍රික්කයෙනි. එය රබර් වතු 273ක් වේ. ඒ හැරුණු විට රත්නපුර (257), කෑගල්ල (241), ගාල්ල (119) සහ මාතර (105) යන දිස්ත්‍රික්කවල 100කට වැඩි රබර් වතු සංඛ්‍යාවක් වාර්තා වී ඇත. අනෙකුත් දිස්ත්‍රික්කවල 100ට අඩු වතු සංඛ්‍යාවක් වාර්තා වී ඇති අතර අම්පාර, කිලිනොච්චි, ත්‍රිකුණාමලය, මන්නාරම, මඩකලපුව, මුලතිව් සහ යාපනය යන දිස්ත්‍රික්කවල රබර් වතු වාර්තාවී නොමැත. (වගු අංක7)

රබර් වගාව යටතේ ඇති වතුවල මුළු බිම් ප්‍රමාණය අක්කර 165,720 ක් වේ. පසුගිය සංගණන වසර (2002) සමඟ සසඳන විට මෙවර රබර් වගා කර ඇති බිම් ප්‍රමාණයෙහි අක්කර 2,570ක වැඩි වීමක් පෙන්නුම් කර ඇත. රබර් වගාව ඇති වතු සංඛ්‍යාවෙන් වැඩි බිම් ප්‍රමාණයක් වාර්තා වී ඇත්තේ ද කෑගල්ල දිස්ත්‍රික්කයෙන්මය. එය අක්කර 56,753කි. මෙම බිම් ප්‍රමාණය 2002 කෘෂිකර්ම සංගණනයේ දී අක්කර 50,038ක් ලෙස වාර්තා වී ඇත. මේ හැරුණු විට කළුතර දිස්ත්‍රික්කයේ අක්කර 37,506 ක් ද, රත්නපුර දිස්ත්‍රික්කයේ අක්කර 28,286ක් ද, කොළඹ දිස්ත්‍රික්කයේ අක්කර 10,300ක් ද, ගාල්ල දිස්ත්‍රික්කයේ අක්කර 9,269ක් ද, කුරුණෑගල අක්කර 6,447ක් ද, මාතර අක්කර 5,143ක් ද වාර්තා වී ඇත. අනුරාධපුර, ගම්පහ, නුවරඑළිය, පුත්තලම, බදුල්ල, මහනුවර, මාතලේ, වවුනියා සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල අක්කර 4,000කට වඩා අඩු බිම් ප්‍රමාණයක් වාර්තාවී ඇත. අම්පාර, කිලිනොච්චි, ත්‍රිකුණාමලය, මන්නාරම, මඩකලපුව, මුලතිව් සහ යාපනය යන දිස්ත්‍රික්කවල රබර් වගා කළ බිම් ප්‍රමාණයක් වාර්තාවී නොමැත. (වගු අංක7)

## රූප සටහන 8 : දිස්ත්‍රික්ක අනුව රබර් වතු ගණන හා රබර් වතු යටතේ ඇති බිම් ප්‍රමාණය




ස්ථම්භ වලට යටින් දක්වා ඇත්තේ තේ වතු ගණනයි.
එකම කාරක තත්ත්වයක් හා එකම භුක්තියක් යටතේ අවම වශයෙන් එක් බිම් කැබැල්ලක් හෝ අක්කර 20 ක් හෝ ඊට වැඩි ගොවි කාණ්ඩයක් වත්තක් ලෙස හැඳින්වේ.

### 4.4: වතුවල කෙරෙන සත්ව පාලනය

ආර්ථික සංගණනයේ (2013/14) වතු ලැයිස්තු ගත කිරීමේදී, එක් එක් දිස්ත්‍රික්කය තුළ සත්ව පාලනය සිදු කරන වතුසංඛ්‍යාව හා බිම් ප්‍රමාණය වගු අංක 8හි දක්වා ඇත.

**වගුඅංක 8:සත්ව පාලනය සිදු කරන වතුසංඛ්‍යාව හා බිම් ප්‍රමාණය**


| දිස්ත්‍රික්කය | වතු සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | |
|---|---|---|---|
| | | අක්කර | හෙක්ටයාර |
| 1.කොළඹ | 10 | 318 | 129 |
| 2.ගම්පහ | 56 | 1,422 | 575 |
| 3.කළුතර | 8 | 165 | 67 |
| 4.මහනුවර | 43 | 1,099 | 445 |
| 5.මාතලේ | 29 | 2,607 | 1,055 |
| 6.නුවරඑළිය | 11 | 2,878 | 1,165 |
| 7.ගාල්ල | 4 | 8 | 3 |
| 8.මාතර | 8 | 54 | 22 |
| 9.හම්බන්තොට | 6 | 1,173 | 475 |
| 10.යාපනය | 1 | 1 | 0.4 |
| 11.කිළිනොච්චි | 1 | 1 | 0.4 |
| 12.මන්නාරම | 1 | 10 | 4 |
| 13.වවුනියා | 0 | 0 | 0 |
| 14.මුලතිව් | 0 | 0 | 0 |
| 15.මඩකළපුව | 5 | 1,151 | 466 |
| 16.අම්පාර | 2 | 23 | 9 |
| 17.ත්‍රිකුණාමලය | 0 | 0 | 0 |
| 18.කුරුණෑගල | 354 | 8,466 | 3,426 |
| 19.පුත්තලම | 71 | 2,771 | 1,121 |
| 20.අනුරාධපුරය | 18 | 2,031 | 822 |
| 21.පොලොන්නරුව | 18 | 3,671 | 1,486 |
| 22.බදුල්ල | 9 | 309 | 125 |
| 23.මොණරාගල | 5 | 128 | 52 |
| 24.රත්නපුර | 6 | 50 | 20 |
| 25.කෑගල්ල | 12 | 424 | 171 |
| **ශ්‍රීලංකාව** | **678** | **28,760** | **11,639** |

ආර්ථික සංගණනයේ වතු ලැයිස්තු ගත කිරීමේ තොරතුරු අනුව සත්ව පාලනය සිදු කරන මුළු වතු සංඛ්‍යාව 678ක් වන අතර එහි මුළු බිම් ප්‍රමාණය අක්කර 28,760ක් වේ. සත්ව පාලනය සිදු කරන වතු සංඛ්‍යාවෙන් වැඩි ප්‍රමාණයක් වාර්තා වී ඇත්තේ කුරුණෑගල දිස්ත්‍රික්කයෙනි. එම සංඛ්‍යාව 354 ක් වන අතර මෙය සත්ව පාලනය සිදු කරන මුළු වතු වලින් 52.2% ක් වේ. සත්ව පාලනය සිදු කරන මුළු බිම් ප්‍රමාණයෙන් (28,760) අක්කර 8,466 ක් කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තා වි ඇති අතර එය ප්‍රතිශතයක් වශයෙන් 29.4% කි. (වගු අංක8)

මීළඟට වැඩිම සත්ව පාලනය සිදු කරන වතු පුත්තලම, ගම්පහ, මහනුවර,සහ මාතලේ යන දිස්ත්‍රික්ක වලින් වාර්තා වී ඇත. අනෙකුත් දිස්ත්‍රික්කවල සත්ව පාලනය සිදු කරන වතු සංඛ්‍යාව 20ට අඩු ප්‍රමාණයක් වන අතර වවුනියාව සහ මුලතිව් දිස්ත්‍රික්කවල සත්ව පාලනය සිදු කරන වතු වාර්තා වී නොමැත.

දිස්ත්‍රික්ක අනුව සත්ව පාලනය සිදු කරන බිම් ප්‍රමාණය සැලකිල්ලට ගතහොත් දෙවන ස්ථානය වාර්තා වී ඇත්තේ පොලොන්නරුව දිස්ත්‍රික්කයෙන්ය. එය අක්කර 3,671 ක් වේ. වතු ප්‍රමාණයෙන් අක්කර 1000-3000 අතර සත්ව පාලනය සිදු කරන දිස්ත්‍රික්ක වශයෙන් නුවරඑළිය ( අක්කර 2,878), පුත්තලම (අක්කර 2,771), මාතලේ (අක්කර2,607), අනුරාධපුරය (අක්කර 2,031), ගම්පහ ( අක්කර 1,422), හම්බන්තොට (අක්කර 1,173), මඩකලපුව ( අක්කර 1,151) සහ මහනුවර ( අක්කර 1,099) යන දිස්ත්‍රික්ක වාර්තා වී ඇත. වවුනියාව, මුලතිව් සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික් හැර අනෙකුත් දිස්ත්‍රික්කවල අක්කර 500 ට අඩු බිම් ප්‍රමාණයක් සත්ව පාලනය සිදු කරන බවට වාර්තා වී ඇත. (වගු අංක8)

## රූප සටහන 9 : දිස්ත්‍රික්ක අනුව වතු යටතේ ඇති සත්ව පාලනය සිදුකරන වතු ගණන හා බිම් ප්‍රමාණය




ස්ථම්භවලට යටින් දන්වා ඇත්තේ වතු ගනනයි

එකම කාරක තත්ත්වයක් එකම භුක්තියක් යටතේ අවම වශයෙන් එක් බිම් කැබැල්ලක් හෝ අක්කර 20 ක් වන හෝ ඊට වැඩි ගොවි කාණ්ඩයක් වත්තක් ලෙස හැඳින්වේ

## 4.5:අයිතිය අනුව වතු වල ව්‍යාප්තිය

ආර්ථික සංගණනයේ (2013/14) වතු ලැයිස්තු ගතකිරීමේ දී ශ්‍රීලංකාවේ වතු, ප්‍රධාන වශයෙන් වතුවල අයිතිය අනුව වර්ග කිරීම් 6 ක් යටතේ හඳුනා ගන්නා ලදී . එනම්,

1. රජයේ වතු
2. අර්ධ රජයේ වතු
3. වැවිලි සමාගම් සතු වතු
4. පුද්ගලික සමාගම් සතු වතු
5. තනි පුද්ගලයකු සතු වතු
6. හවුල් අයිතියක් ඇති වතු

**වගුඅංක 9:දිස්ත්‍රික්කය සහ අයිතිය අනුව වතු සංඛ්‍යාව**

| දිස්ත්‍රික්කය | වතු සංඛ්‍යාව | | | | | |
|---|---|---|---|---|---|---|
| | රජයේ | අර්ධ රජයේ | වැවිලි සමාගම් | පුද්ගලික සමාගම් | පුද්ගලික තනි | පුද්ගලික හවුල් |
| 1.කොළඹ | 8 | 2 | 13 | 12 | 56 | 9 |
| 2.ගම්පහ | 16 | 34 | 4 | 42 | 256 | 56 |
| 3.කළුතර | 11 | 6 | 41 | 22 | 179 | 66 |
| 4.මහනුවර | 13 | 28 | 20 | 27 | 185 | 48 |
| 5.මාතලේ | 8 | 19 | 12 | 33 | 158 | 41 |
| 6.නුවරඑළිය | | 11 | 118 | 24 | 75 | 24 |
| 7.ගාල්ල | 14 | 3 | 19 | 22 | 156 | 35 |
| 8.මාතර | 10 | 6 | 16 | 20 | 209 | 45 |
| 9.හම්බන්තොට | 20 | 5 | 0 | 5 | 67 | 16 |
| 10.යාපනය | 0 | | 0 | 0 | 4 | 1 |
| 11.කිළිනොච්චි | 5 | 6 | 1 | 0 | 194 | 6 |
| 12.මන්නාරම | 1 | 1 | 0 | 1 | 3 | 0 |
| 13.වවුනියා | 3 | 0 | 0 | 2 | 2 | |
| 14.මුලතිව් | 0 | 0 | 0 | 0 | 28 | 1 |
| 15.මඩකළපුව | 1 | 2 | | 1 | 35 | 1 |
| 16.අම්පාර | 6 | 2 | 0 | 2 | 12 | 1 |
| 17.ත්‍රිකුණාමලය | දිස්ත්‍රික්කයේ වතු නොමැත | | | | | |
| 18.කුරුණෑගල | 70 | 71 | 76 | 113 | 1,272 | 181 |
| 19.පුත්තලම | 23 | 16 | 24 | 60 | 1,045 | 71 |
| 20.අනුරාධපුර | 8 | 4 | 1 | 8 | 29 | 5 |
| 21.පොළොන්නරුව | 5 | 3 | 0 | 22 | 25 | 4 |
| 22.බදුල්ල | 4 | 4 | 73 | 35 | 84 | 7 |
| 23.මොණරාගල | 6 | 3 | 2 | 15 | 67 | 2 |
| 24.රත්නපුර | 9 | 6 | 54 | 36 | 369 | 80 |
| 25.කෑගල්ල | 3 | 4 | 43 | 25 | 207 | 61 |
| **ශ්‍රීලංකාව** | **244** | **236** | **517** | **527** | **4,717** | **761** |

මෙම වර්ග කිරීම යටතේ අමාත්‍යාංශයකට හෝ දෙපාර්තමේන්තුවකට අයිතිව ඇති ඔවුන් විසින් වගාව නඩත්තු කරන වතු, **රජයේ වතු** ලෙසද අයිතිය අර්ධ රාජ්‍ය ආයතන සතුව පවතින වතු **අර්ධ රජයේ වතු** ලෙසද 1992 වසරේදී ක්‍රියාත්මක වූ රාජ්‍ය වතු පෞද්ගලීකරණ වැඩසටහන යටතේ බදු දී ඇති ආයතන **වැවිලි සමාගම් සතු වතු** ලෙසද පුද්ගලයින් දෙදෙනෙකු හෝ ඊට වැඩි පිරිසක් එකතු වී, සමාගම් නීතිය යටතේ ලියාපදිංචි කොට ඇති ඔවුන් සතු වතු **පුද්ගලික සමාගම් සතු වතු** ලෙස ද කිසියම් තනි පුද්ගලයෙකු සතු වතු **පුද්ගලික තනි වතු** ලෙස ද පුද්ගලයින් දෙදෙනෙකු හෝ ඊට වැඩි පුද්ගලයින් සංඛ්‍යාවක් විසින් හවුල් අයිතිය ඇතිව නඩත්තු කරනු ලබන වතු **පුද්ගලික හවුල් වතු** ලෙසද 2013/14 ආර්ථික සංගණනයේ දී හඳුනාගන්නා ලදී.


මෙම හඳුනාගැනීම මත ශ්‍රී ලංකාවේ පුද්ගලික තනි වතු 4,717ක්, පුද්ගලික හවුල් වතු 761ක්, පුද්ගලික සමාගම් සතු වතු 527ක්, වැවිලි සමාගම් සතු වතු 517ක්, රජයේ වතු 244ක්, අර්ධ රජයේ වතු 236ක් වාර්තා වී ඇත. (වගු අංක 9)

මුළු වතු සංඛ්‍යාවෙන් 67% ක් තනි පුද්ගල වතු වන අතර 11% ක් පුද්ගලික හවුල් වතු වේ. අයිතිය අනුව වතු වල අනෙක් වර්ග කිරීම් හතරෙහිම එකතුව 22 % වන අතර එයින් රජයේ සහ අර්ධ රජයේ වතු වෙන වෙනම 5% කටත් වඩා අඩු මට්ටමක පැවතීම කැපී පෙනෙන ලක්ෂණයකි.


පසුගිය සංගණන වර්ෂයේ (2002) වතු ලැයිස්තුගත කිරීමට අනුව වතුවල අයිතිය ප්‍රධාන වශයෙන් රජයේ හා සමාගම් සතු වතු, තනි පුද්ගල වතු ලෙස හඳුනාගන්නා ලද අතර එහිදී රජයේ හා සමාගම් සතු වතු 1,634ක්, තනි පුද්ගල වතු 4,943ක් වී ඇත.

පසුගිය සංගණන වර්ෂයේ (2002) සංඛ්‍යාලේඛන සමඟ 2013/14 ආර්ථික සංගණනයේ වතු ලැයිස්තුගත කිරීමේ සංඛ්‍යාලේඛන සැසඳීමේදී රජයේ වතු කැපී පෙනෙන ලෙස පහළ ගොස් ඇති අතර පුද්ගලික වතු වල කැපී පෙනෙන ඉහළ යාමක් දක්නට ලැබේ.

**රූප සටහන 10: අයිතිය අනුව වතු සංඛ්‍යාව බෙදී යන ආකාරය**



## රූප සටහන 11 : දිස්ත්‍රික්කය හා අයිතිය අනුව සංඛ්‍යාව




එකම කාරක තත්ත්වයක් එකම භුක්තියක් යටතේ අවම වශයෙන් එක් බිම් කැබැල්ලක් හෝ අක්කර 20 ක් වන හෝ ඊට වැඩි ගොවි කාණ්ඩයක් වත්තක් ලෙස හැඳින්වේ.